# අපූරු ලොකු සර්




ඔමයා උද්‍යාමි ඒකනායක

# අපූරු ලොකු සර්


## ඔමයා උදයාමි ඒකනායක

කතෘ


**වෙනත් කෘති**

- My Doll Shini ( ISBN 978-624-208-111-3 ) 2023-07
- පැණි කුරුලු ගෙදර ( ISBN 978-624-208-641-5 ) 2025-02


**මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර**

**3 ශ්‍රේණිය**



**2025-02-08**

**ISBN - 978-624-208-642-2**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර



එක කාලෙක ලස්සන පුංචි ගමක ලස්සන පුංචි ඉස්කෝලයක් තිබුනා.

ඉතින් මේ ඉස්කෝලේ අලුත් අවුරුද්දට එක වසරට අලුත් නංගිලා මල්ලිලා ආවා.

හැබැයි එක පුංචි මල්ලි කෙනෙක් ගේට්ටුව ළඟ "මට ඉස්කෝලේ යන්න බැහැ මට අම්මා ඕනේ.. මට ඉස්කෝලේ යන්න බැහැ" කියලා හැමදාම උදේට අඬන්න පටන් ගත්තා.

මේක ඉස්කෝලේ ලොකු සර් බලාගෙන හිටියා.



ලොකු සර් පුංචි ළමයා ළඟට ගියා. ළමයාට ආදරේන් කතා කලා.

ආදරේන් ඔළුව අත ගෑවා.

"කමල් අම්මාට ගෙදර යන්න කියමු නේද? " ලොකු සර් ඇහුවා.



අම්මා ගෙදර  ගියා. ලොකු සර් කමල්ගේ අතින් අල්ලාගෙන ඉස්කෝලේ වටේම එක්කන් ගියා.

ලොකු සර් එක්ක කමල් ඇවිදිද්දී කමල්ට හරිම සතුටුයි.

ලොකු සර් කමල්ට ඉස්කෝලේ අක්කලා අයියලා සතුටින් ඉගෙන ගන්න හැටි, සෙල්ලම් කරන හැටි පෙන්නුවා.

පෙන්නලා කමලුත් ඉස්කෝලේට සතුටින් ඇවිත් හොඳින් ඉගෙන ගන්නවා නම්, සෙල්ලම් බඩුවක් ගෙනත් දෙන්න පොරොන්දු වුණා.



1 2 3 4 5 6 7 8
9 10 11 21 13 14
15 16 17 18 19
20 21 22 23
24
විදුහල්පති

කමල් සතුටින් "මට පුංචි කාර් එකක් ඕනේ" කිව්වා. කමල් සතුටින් ඉස්කොලෙ එන්න ගත්තා. මේක බලා ගෙන හිටපු ලොකු සර් පොරොන්දු වුන කාර් එක කමල්ට තෑගි කරා. මේ විදිහට සතුටින් ඉස්කොලේ අවිත් ඉගෙන ගන්න ලොකු සර් අවවාද කරා.

මේ විදිහට පුංචි කමල් සතුටින්  ඉගෙන ගන්න කියලා දුන්න ලොකු සර් මගේ "ලොකු අත්තා".

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්